**හම්බන්තොට මහා නගර සභාව - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී හම්බන්තොට මහජන පුස්තකාලයට පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ එකතුව රු. 2,733,162 ක් වූ පරිගණක හා උපාංග සහ අන්තර්ජාල උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කඩ කාමර බදු දීමේදී අයකළ රු. 1,912,900 ක් වූ එක්වන් මුදල් ආදායමක් ලෙස ගිණුම්ගත නොකර ආරක්ෂිත ඇප තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | වසර 05 ක් ඉක්ම වූ එක්වන් මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුහුණු ප්ලාසා වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර 02 කින් ලැබිය යුතු එකතුව රු. 785,000 ක් වූ එක්වන් මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අස්පෘශ්‍ය වත්කම් වල වටිනාකම රු. 256,250 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | අස්පෘශ්‍ය වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 97,500 ක කොම්පෝස්ට් තොගය අතැති තොගයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | තොගය වත්කමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 94,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ මුදල පමණක් ගිණුම්ගත කළ බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | |
| | i. 247ඇ(1) (1අ) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ යම් වෘත්තියක් කරගෙන යනු ලබන තැනැත්තන්ගෙන් ගාස්තුවක් අයකළ කළ හැකි වුවත් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වෛද්‍ය, නොතාරිස් හා රෙජිස්ටාර් වැනි වෘත්තිකයන්ගෙන් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෘත්තීය බදු අය කිරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ii. 272 වගන්තිය | ප්‍රධාන කාරණා 32 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 30 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | ඉදිරියේදී අවශ්‍යතාවය මත අදාල අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | එකතුව රු. 1,864,424 ක් වූ වසර 02 ඉක්ම වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂ 151 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර 02 ඉක්ම වූ තැන්පත් මුදල් නියාදනය කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,404,146 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,972,623 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 12,736,600 | 13,408,278 | 12,395,219 | 6,681,072 | 11,410,540 | 12,095,626 | 9,584,967 | 5,668,013 |
| කුලී | 35,723,700 | 36,718,866 | 37,387,859 | 2,890,140 | 32,744,835 | 35,201,652 | 28,875,896 | 3,559,133 |
| බලපත්‍ර ගාස්තු | 3,470,000 | 4,999,700 | 3,682,523 | 2,756,023 | 3,880,500 | 2,827,323 | 2,084,947 | 1,438,846 |
| වෙනත් ආදායම් | 6,132,400 | 7,846,829 | 6,919,199 | 2,289,527 | 3,932,350 | 6,397,996 | 6,338,424 | 1,361,897 |
| **එකතුව** | **58,062,700** | **62,973,673** | **60,384,800** | **14,616,762** | **51,968,225** | **56,522,597** | **46,884,234** | **12,027,889** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 5940 කින් ලැබිය යුතු වරිපනම් බදු රු. 5,589,076 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | මහා නගර සභා ආඥා පනතේ 252 වගන්තිය ප්‍රකාරව හිඟය රු. 10,000 ට වැඩි දේපළ හිමියන් 45 කින් ලැබිය යුතු වරිපනම් බදු මුදල් රු. 1,480,103 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දේපළ තහනම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 69 කින් අයවිය යුතු කසල බදු රු. 570,796 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර හා කර්මාන්ත ඒකක 231 කින් ලැබිය යුතු රු. 508,200 ක ව්‍යාපාර හා කර්මාන්ත බදු අයකර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ 247 (ආ) 4 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සභාව බදුකරුවන් සමඟ අත්සන් කළ ගිවිසුමට අනුකූල නොවන ලෙස සභාව සතු කඩකාමර 03 ක් 2017, 2019 හා 2022 වර්ෂවලදී අතුරු බදු දී තිබුණු අතර එසේ අතුරු බදුදීම් වැළැක්වීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | අතුරු බදු දී ඇති කඩ කාමර ඉදිරියේදී මුද්‍රා තැබීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩකාමර හා ගොඩනැගිලි බදුදීම වෙනුවෙන් ඒකක 47 කින් ලැබිය යුතු කුලිය රු. 2,383,785 ක් මහා නගර සභා ආඥා පනතේ 253 (1) වගන්තිය ප්‍රකාරව අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම මත ලැබිය යුතු කුලී රු. 506,355 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් යොමු කළ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඌ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව සෑම ගිවිසුමක්ම වසර තුනකට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, සභාව සතු කඩකාමර 20 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් යාවත්කාලීන නොකරන ලද කාල පරාසය වසර 03 ත් 35 ත් අතර විය. | කඩ කාමරයක් මුද්‍රා තැබීමට හා ඉතිරි කඩ කාමර වල ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 183 කින් ලැබිය යුතු රු. 464,500 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට මහා නගර සහා ආඥා පනතේ 247 (ආ) 4 වගන්තිය පරිදී කටයුතු කර නොතිබුණි. | වර්ෂයකට වඩා හිඟහිටි ශේෂය අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත් බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 2,225,033 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 2,119,033 ක් සඳහා නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරෙන්තු ගාස්තු, දඩපොලී හා සේවා සඳහා ගාස්තු පිළිවෙලින් රු. 820,614 ක්, රු. 743,320 ක් හා රු. 333,835 අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඕ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 611,807 ක් හා රු. 2,069,148 ක් විය. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජුනි 25 දින ආරම්භ කළ කච්ෂිමා යන්ත්‍රය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිනකට කසළ ටොන් 30 ත් 50 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වුවත් සහා බල ප්‍රදේශයේ දෛනිකව රැස්වන දිරන කසළ ප්‍රමාණය ටොන් එකක් වූයෙන් කසළ අවශ්‍යතාවය රැස්කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර එය රැස්කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක්ද සකස් කර නොතිබුණි. | ආසන්න ප්‍රාදේශීය සභා වලින් කසළ ලබා නොදීම සහ පුද්ගලික ආයතන සමඟ ඒකාබද්ධ වී කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා අලෙවි කිරීම සඳහා ගිවිසුම්ගත වීමට කළ සාකච්ඡා අසාර්ථක වූ බව. | කසළ රැස් කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1997 වර්ෂයේදී බදු දී තිබූ සභාවට අයත් තිස්ස පාර ඉඩම් 10 ක් සඳහා අයකළ යුතු කුලිය 2016 අප්‍රේල් 12 දිනැති තක්සේරු වාර්තාව පරිදි බදු කුලී අය කිරීමට අනුමැතිය ලැබී තිබියදී, මාසික බදු කුලිය ලෙස රු. 165 ක් අයකිරීම මත 2016 අප්‍රේල් 27 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා සහා අරමුදලට වූ පාඩුව රු. 5,508,000 ක් විය. එසේම බදු කොන්දේසි කඩ කරමින් මෙම ඉඩම් තුල සාදා ඇති ගොඩනැගිලි බදු ගැනුම්කරුවන් විසින් අතුරු බදුදී මාසිකව රු. 15,000 හා රු.150,000 අතර ආදායමක් අවිධිමත්ව උපයාගෙන තිබුණි. | නව තක්සේරු බදු මුදල අයකර ගැනීමට උත්සාහ කළද එය අයකර ගැනීමට නොහැකි වූ බව සහ ගිවිසුම් හා අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව. | තක්සේරු වාර්තාව පරිදි කුලී අයකළ යුතු අතර කුලී නොගෙවයි නම් බදු කොන්දේසි අනුව කටයුතු කළයුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2020 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරණ ලිපිය අනුව නව වීථි පහන් සවිකිරීමේදී විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එපරිදි කටයුතු නොකිරීම මත සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව වෙනුවෙන් වැයකර තිබූ රු.2,692,048 ක වියදම ප්‍රතිපූර්ණය කරගත නොහැකි වී තිබුණි. | සවි කළ වීථි ලාම්පු සඳහා අනුමැතිය ලබා ගැනීමට විදුලිබල මණ්ඩලය අනුමැතිය ලබා නොදුන් අතර දැනට වියදම් ප්‍රතිපූර්ණය සඳහා ගිවිසුම්ගත නොවන බව. | ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපප/පාපාකො/2010/01 දරණ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව බදු කුලිය තක්සේරු කර සභාව සම්මත කරගෙන තිබුණත් කඩකාමර හා ඉඩම් 57 කට අදාළව පැරණි කුලිය අයකිරීම මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභා අරමුදලට වූ පාඩුව රු.12,907,115 ක් විය. | අංක 28 කඩ කාමරය මුද්‍රා තැබීමට, ඉඩම් හා කඩ කාමර 10 සම්බන්ධයෙන් නව තක්සේරුව පරිදි ඉදිරියේදී ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති කාර්ය මණ්ඩලයේ හත් දෙනෙකු සඳහා 2021 හා 2022 වර්ෂ වලදී ඉටුකළ රාජකාරි පිළිබඳ තහවුරුවක්, රාජකාරි කළ දින ගණන හා රාජකාරි කළ වේලාව තහවුරු කර නොගෙන රු. 1,274,000 ක දීමනාවක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ඉටු කරනු ලබන රාජකාරී පිළිබඳව හා රාජකාරී වේලාවන් පිළිබඳව වාර්තා පවත්වාගත යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මහා නගර සහා ආඥා පනතේ 45 වන වගන්තිය ප්‍රකාරව සභාව භුක්ති විඳින ඉඩම් 81 ක හා ගොඩනැගිලි 08 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරා ගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිපි ගොනු යොමු කළ බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත හා පෙර වර්ෂයේදී ධාවනයෙන් ඉවත් කළ වාහන 02 ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | එක් රථයක් අලුත්වැඩියා කරන බව සහ ඉතිරි රථය සඳහා ලියාපදිංචි ආයතනයෙන් එකඟතාවය ලද පසු අපහරණය කරන බව. | වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිරිබෝපුර ළමා උද්‍යානය ඉදිකිරීමේ කර්මාන්තය යටතේ ළමා උද්‍යානය ඉදිකිරීමට අවශ්‍ය පස් කපා ප්‍රවාහනය කිරීම සඳහා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් පස් කියුබ් 600 ක් සඳහා පමණක් අනුමැතිය ලැබී තිබියදී සභාව විසින් පස් කියුබ් 1638 ක් කපා ප්‍රවාහනය කර තිබීමෙන් අනුමැතිය ලබා නොගෙන කැනීම් කළ පස් ප්‍රමාණය කියුබ් 1038 ක් විය. | පස් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා විටින් විට ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ග්‍රාම නිලධාරී හා සභාවේ තාක්ෂණික නිලධාරී සම්බන්ධ වී අවශ්‍ය පස් ප්‍රමාණය කපා ප්‍රවාහනය කළ බව. | අනුමැතිය ලද පස් කියුබ් ප්‍රමාණය ඉක්මවා පස් කැපීම සිදු නොකළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලයෙහි පැවති තනතුරු 04 කට අදාළ සේවක අතිරික්තතා 08 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අතිරික්තය අනුමත කර ගැනීමට ඉල්ලීම් කර ඇති බව. | අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ සේවකයින් 23 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැරව වෙනත් රාජකාරිවල නිරත වී තිබුණි. | සේවා අවශ්‍යතාවය මත ප්‍රාථමික මට්ටමේ සේවකයින් යොදවා කාර්යාලයේ රාජකාරී ඉටුකර ගැනීමට කටයුතු කරන බව. | සේවකයින් අනුමත රාජකාරිවල යෙදවිය යුතුය. |
| (ඇ) | සේවය හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 212,450 ක් වූ උත්සව, විශේෂ හා ආපදා ණය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |